සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved



තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය ............................ යුරෝපා ඉතිහාසය I කාලය පැය තුනයි

උපදෙස්

- මෙම කොටසේ ප්‍රශ්න 40 ක් ඇත. සියළු ප්‍රශ්න වලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර පහක් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ එයින් එකක් පමණි. ප්‍රශ්නයට නිවැරදි පිළිතුර වශයෙන් ඔබ එක් ප්‍රතිචාරයක් තෝරාගත් පසු එය දක්වා ඇති උපදෙස් පරිදි ලකුණු කරන්න.
- I කොටසට පිළිතුරු ලියා අවසන් වූ පසු II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාර දෙන්න.

## I කොටස

◈ **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්න සඳහා දී ඇති නම් පහෙන් එකක් අනෙක් නම් සමග නොගැළපේ. එම නොගැළපෙන නමෙහි අංකය වරහන තුළ ලියන්න.**

01. 1. ඇරගන් 2. නවාර් 3. කැස්ටීල්
4. ග්‍රැනඩා 5. ප්‍රෂියා (.....)

02. 1. වර්ජිල් 2. හොරේස් 3. ලිවි
4. සැෆෝ 5. සැලුස්ට් (.....)

03. 1. ආයෝනියන් මුහුද 2. ඊජියන් මුහුද 3. රතු මුහුද
4. ආන්ද්‍රියාතික් මුහුද 5. උතුරු මුහුද (.....)

04. 1. ඇනෙක්සිමීනීස් 2. තේලීස් 3. බැල්බෝවා
4. ඇනක්සිමැන්ඩර් 5. ඇරිස්ටෝටල් (.....)

05. 1. ආකිමිඩීස් 2. ඊස්කිලස් 3. යුරිපිඩීස්
4. ඇරිස්ටෝෆෙනීස් 5. සොෆොක්ලීස් (.....)

06. 1. වින්සර් 2. බූර්බෝන් 3. ස්ටුවට්
4. හැනෝවර් 5. ටියුඩර් (.....)

07. 1. මැගලන් සමුද්‍ර සන්ධිය 2. ඩෝවර් සමුද්‍ර සන්ධිය 3. ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය
4. ජිබෝල්ටා සමුද්‍ර සන්ධිය 5. බොස්පරස් සමුද්‍ර සන්ධිය (.....)

08. 1. මාකස් අවුරේලියස් 2. හාඩ්‍රියන් 3. ඔගස්ටස්
4. ස්පාටකස් 5. නීරෝ (.....)

09. 1. හත් වැනි හෙන්රි 2. අටවැනි හෙන්රි 3. මාරි අන්ටොයිනට්
4. මේරි ටියුඩර් 5. පළමු වැනි එලිසෙබෙත් (.....)

10. 1. ෂේක්ස්පියර් 2. මිල්ටන් 3. බොකැෂියෝ
4. වර්ඩ්ස්වර්ත් 5. චාල්ස් ඩිකන්ස් (.....)

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්න වල දී ඇති පද යුගල වලින් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැලපෙන යුගලයෙහි අංකය වරහන තුළ ලියන්න.**

11.
1. ජුපිටර් - අහසට අධිපති
2. මාර්ස් - යුද්ධයට අධිපති
3. වීනස් - ආලයට අධිපති
4. නෙප්චූන් - මුහුදට අධිපති
5. මිනර්වා - අස්වැන්නට අධිපති (.....)

12.
1. ග්‍රීක ශිෂ්ටාචාරය - පාතීනන් දේවස්ථානය
2. රෝම ශිෂ්ටාචාරය - ට්‍රාජන් අධිරාජ්‍යාගේ ප්‍රතිමාව
3. මිනෝවන් ශිෂ්ටාචාරය - සමාරා පල්ලිය
4. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය - දේවවරම්වාදී අදහස් ප්‍රබල වීම.
5. ඉස්ලාම් ශිෂ්ටාචාරය - අල්හම්බ්‍රා මාලිගය (.....)

13.
1. මාටිං ලූතර් - ජර්මන්
2. ජොන් කැල්වින් - ප්‍රංශය
3. ජෝන් වෛක්ලිෆ් - එංගලන්තය
4. උල්රිච් ස්විංග්ලි - ස්විසර්ලන්තය
5. ලියනාඩෝ ඩාවිංචි - පෘතුගාලය (.....)

14.
1. රොබට් පුල්ටන් - දුම් බෝට්ටුව
2. සැමුවෙල්මෝස් - විදුලි පණිවුඩ ක්‍රමය
3. හෙන්රි බෙල් - දුම්නැව
4. ජෝර්ජ් ස්ටීවන්සන් - දුම්රිය එංජිම
5. ඩෙම්ලර් - ගුවන්යානය (.....)

15.
1. හැප්ස්බර්ග් - ඔස්ට්‍රියාව
2. බූර්බන් - ප්‍රංශය
3. බ්‍රැගන්සා - පෘතුගාලය
4. ඔරේන්ජ් - ඉතාලිය
5. රොමනොෆ් - රුසියාව (.....)

- **අංක 16 - 25 තෙක් වූ ප්‍රශ්නය සඳහා x හා y තීරුවල නාම/ප්‍රකාශන/දින වකවානු දී ඇත. x හා y තීරු ගැළපෙන අනුපිළිවෙළට සකස්කළ විට පහත දී ඇති සංකේත පහෙන් එකක් නිවැරදිය. එම නිවරදි අංකය තෝරා වරහන තුළ යොදන්න.**

16.

| | X | | Y |
|---|---|---|---|
| 1. | සියුස් | A | ඇතැන්ස් |
| 2. | ඇතීනා | B | කොරින්ත් |
| 3. | ඇපලෝ | C | ඔලිම්පියා |
| 4. | ඇෆ්‍රඩයිටී | D | සමුද්‍රයට අධිපති |
| 5. | ප්‍රොසයිඩන් | E | ඩෙල්පි |

1. CABDE 2. ACDBE 3. EBACD 4. CDABE 5. CAEBD (.....)

17.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ප්ලේටෝ | A | ප්‍රශ්නෝත්තර තර්ක ක්‍රමය |
| 2. | ඇරිස්ටාකස් | B | පරමාදර්ශී රාජ්‍ය |
| 3. | සොක්‍රටීස් | C | ඉතිහාසයේ පියා |
| 4. | හෙරඩෝටස් | D | බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා |
| 5. | හිපොක්‍රටීස් | E | ගණිතඥයෙකි. |

1. EBCDA 2. ABEDC 3. EABCD 4. BEACD 5.ABCDE (.....)

18.

| | X | | Y |
|---|---|---|---|
| 1. | බස්රාවේ අල්හසන් | A | වසූරිය රෝගය |
| 2. | අල්රාසි | B | වෛද්‍ය විද්‍යාවේ අත්පොත |
| 3. | රශේස් | C | දෘෂ්ටි විද්‍යාව |
| 4. | අවිසින්නා | D | රුබයියාට් |
| 5. | ඕමාර් ඛයියාම් | E | වෛද්‍ය විද්‍යාවේ පරිචය |

1. CAEBD 2. ACDEB 3. BACDE 4. EACBD 5. DABCE (.....)

19.

| | X | | Y |
|---|---|---|---|
| 1. | බිසොවගේ යුද්ධය | A | නිජ්වේගන් ගිවිසුම |
| 2. | තිස් අවුරුදු යුද්ධය | B | යුට්රේට් ගිවිසුම |
| 3. | ඕලන්ද යුද්ධය | C | අයිලාචැපෙල් ගිවිසුම |
| 4. | ඔග්ස්බර්ග් සංගම් යුද්ධ | D | වෙස්ට් ජේලියා ගිවිසුම |
| 5. | ස්පාඤ්ඤ කිරීටය සම්බන්ධ යුද්ධ | E | රිස්විග් සාම ගිවිසුම |

1. ABCDE 2. CDAEB 3. EBCDA 4. ACBDE 5. DECBA (.....)

20.

| | X | | Y |
|---|---|---|---|
| 1. | පෘතුගාලය | A | හෙන්රි හඩ්සන් |
| 2. | එංගලන්තය | B | බර්තලමියු දියෙස් |
| 3. | ස්පාඤ්ඤය | C | ලාසෙලේ |
| 4. | ප්‍රංශය | D | ෆ්‍රැන්සිස්කෝ පිසරෝ |
| 5. | ඕලන්දය | E | ගිල්බර්ට් |

1. BEDCA 2. BACDE 3. ABCDE 4. AEBDC 5. AECDB (.....)

21.

| | X | | Y |
|---|---|---|---|
| 1. | ජෝන් කේ | A | ස්පිනිං ජෙනිය |
| 2. | ජේම්ස් හාග්‍රීව්ස් | B | විදුලි උදුන |
| 3. | ඒබ්‍රහම් ඩර්ඩ් | C | රෝලර් යන්ත්‍රය |
| 4. | විලියම් සීමන්ස් | D | දුවන නඩාව |
| 5. | හෙන්රි කෝට් | E | යකඩ නිපදවීමේ ක්‍රමය |

1. CABDE 2. DAEBC 3. EBACD 4.DBACE 5.ABCDE (.....)

22.

| | X | | Y |
|---|---|---|---|
| 1. | 1840 | A | විදුලි පණිවුඩ ක්‍රමය |
| 2. | 1844 | B | දුරකථනය |
| 3. | 1866 | C | ගුවන් විදුලිය |
| 4. | 1876 | D | පෙනී තැපැල් සේවය |
| 5. | 1899 | E | කේබල් ක්‍රමය |

1. EBCDA 2. ABCDE 3. DAEBC 4.EDCEB 5. BADCE (.....)

23.

| | X | | Y |
|---|---|---|---|
| 1. | දුප්පතුන්ට දානය පිරිනැමීම | A | චාලිමේන් |
| 2. | පළමු ශුද්ධ රෝම අධිරාජ්‍යා | B | අබුබකර් |
| 3. | මිලාන් ආඥාව | C | අපොස්තලුවරුන් |
| 4. | මහමද්තුමාගෙන් පසු පැමිණි අනුප්‍රාප්තිකයා | D | කොන්ස්ටන්ටයින් අධිරාජ්‍යා |
| 5. | යුදෙව්වන්ට ධර්මය දේශනා කිරීම | E | සක්වාන් |

1. ADBEC 2. CABDE 3. EDABC 4. EADBC 5. BACDE (.....)

24. X | Y

| | X | | Y |
|---|---|---|---|
| 1. | ගුසියාඩිනි | A | ආදම් හා ඒව උද්‍යානයෙන් නෙරපීම |
| 2. | මැසැක්සිබ් | B | ඩේවිඩ් |
| 3. | බොට්ටි සෙල්ලි | C | වීනස්ගේ උපත |
| 4. | රෆායල් | D | දෙවන ජුලියස් පාප්තුමා |
| 5. | ඩොනටෙලෝ | E | ඉතාලියේ ඉතිහාසය |

1. AEBCD 2. DCAEB 3. BACED 4 EACDB 5. BCADE (.....)

25.

| | X | | Y |
|---|---|---|---|
| 1. | රෝන් ගංගාව | A | කළු මුහුද |
| 2. | සේන් ගංගාව | B | ඉංග්‍රීසි ඕඩය |
| 3. | ඩැනියුබ් ගංගාව | C | ආන්ද්‍රියාතික් මුහුද |
| 4. | විස්ටියුලා ගංගාව | D | මධ්‍යධරණී මුහුද |
| 5. | පෝ ගංගාව | E | බෝල්ටික් මුහුද |

1. DBAEC 2. BADEC 3. ADBCE 4. EBACD 5. CADBE (.....)

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් නිවැරදිය. එම නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**
  Aහා B පමණක් නිවැරදි නම් අංක 1 ද B හා C පමණක් නිවැරදි නම් අංක 2 ද
  C හා D පමණක් නිවැරදි නම් අංක 3 ද A හා C පමණක් නිවැරදි නම් අංක 4 ද
  ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි ගණනක් නිවැරදි නම් අංක 5 ද අදාළ හිස්තැනෙහි ලියන්න.

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| A සහ B පමණක් නිවැරදිය. | B සහ C පමණක් නිවැරදිය. | C සහ D පමණක් නිවැරදිය. | Aහා C පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

26. පහත දක්වෙන නම් අතරින් ග්‍රීක පුර රාජ්‍යයන් මොනවාද?
A) රෝමය B) එල්බ් C) ඔලිම්පියා D) ඩෙල්පි (.....)

27. පහත දැක්වෙන්නන් අතරින් රෝම සාහිත්‍යකරුවන් කවුරුන්ද?
A) මයිරන් B) ප්ලූටාක් C) ජුවෙනෙල් D) සෙනෙකා (.....)

28. පහත දැක්වෙන කරුණු අතරින් ග්‍රීක ශිෂ්ටාචාරයෙන් යුරෝපය ලද දායාද මොනවාද?
A) ශුද්ධ රෝම අධිරාජ තනතුර B) ශුද්ධ රෝම අධිරාජ තනතුර
C) ත්‍රිකෝනමිතික ක්‍රමය D) රෙදි සායම් කිරීම (.....)

29. ජාතික රාජ්‍යක ප්‍රධාන ලක්‍ෂණ මොනවාද?
A) බලය සංකේන්ද්‍රගත වීම. B) ස්ථිර යුද්ධ හමුදාවක් පවත්වා ගැනීම.
C) ස්වයං පෝෂිත ආර්ථිකය D) වරප්‍රසාදලත් ප්‍රභූ පන්තිය (.....)

30. එංගලන්තයේ පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමට තුඩුදුන් පනත්,
A) 1689 මහජන අයිතිවාසිකම් ප්‍රකාශ කිරීමේ පනත
B) 1832 ප්‍රතිසංස්කරණ පනත
C) 1765 මුද්දර පනත
D) 1767 ටවුන්ඩ්සෙන්ඩ්ගේ ආදායම් බදු පනත් (.....)

- **අංක 31 - 35 තෙක් සෑම ප්‍රශ්නයකටම එක් එක් මාතෘකාව යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතරින් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ එම නොගැළපෙන කරුණ තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

31. දේශගවේෂණ වල ප්‍රතිඵල
    1. නව වෙළඳ සබඳතා ඇතිවීම.
    2. යුරෝපීය අධිරාජ්‍ය ගොඩනැගීම.
    3. කාර්මික විප්ලවයට මග පෑදීම.
    4. ප්‍රංශ විප්ලවය ඇති වීම.
    5. ක්‍රිස්තු ධර්මය පැතිරීම. (.....)

32. ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් වීම.
    1. ශුද්ධ රෝම අධිරාජ්‍යයා සමඟ ඥාති සබඳතා ඇති කර ගැනීම.
    2. පළමුවන චාල්ස් රජුට ශුද්ධ රෝම අධිරාජ නතතුර ලැබීම.
    3. පොදු නීති පද්ධතියක් රට තුල ක්‍රියාත්මක වීම.
    4. රිචලියු විශාල කාර්යභාරයක් ඉටුකිරීම.
    5. වැඩවසම් ප්‍රධානය දුර්වල කිරීම. (.....)

33. ආගමික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල
    1. යුරෝපය ආගමික වශයෙන් දෙකඩ වීම.
    2. පාප්තුමාගේ බලය පිරිහීම.
    3. ආගමික යුද්ධ හා ගැටුම් ඇතිවීම.
    4. මිෂනාරි ව්‍යාපාරය ආරම්භ වීම.
    5. කාර්මික විප්ලවය ඇතිවීම. (.....)

34. තිස් අවුරුදු යුද්ධයේ ප්‍රතිඵල
    1. ශුද්ධ රෝම අධිරාජ්‍ය, නාමමාත්‍රික තත්වයට පත්වීම.
    2. ප්‍රංශය යුරෝපයේ බලවත් රාජ්‍ය බවට පත්වීම.
    3. ස්වීඩනයට බෝල්ටික් මුහුදේ වෙළඳ අයිතිය ලැබීම.
    4. ආගමික ගැටුම් සමථයට පත්වීම.
    5. ජර්මනිය එක්සත් වීම. (.....)

35. බොස්ටන් තේ සාදය
    1. බ්‍රිතානය රජය විසින් බොස්ටන්වරාය තවදුරටත් විවෘත කර තැබීම.
    2. සැමුවෙල් ඇඩම්ස් ප්‍රධාන කණ්ඩායමක තේ පෙට්ටි මුහුදට දැමීම.
    3. අපරාධ චෝදනා ලැබූ ජනපද වාසීන්ගේ නඩු එංගලන්තයේ දී විසදීම.
    4. මැසචුසෙට්ස් ජනපදයට ලබාදී තිබූ වරදාන පත්‍රය අවලංගු කිරීම.
    5. ජනපදය තුළ ප්‍රසිද්ධ රැස්වීම් තහනම් කිරීම. (.....)

- **අංක 36 සිට 40 තෙක් ප්‍රශ්නවලට අදාලව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන 1,2,3,4,5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදිය | වැරදිය |
| 2. | නිවැරදිය | නිවැරදිය |
| 3. | වැරදිය | වැරදිය |
| 4. | වැරදිය | නිවැරදිය |
| 5. | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදාදෙයි. |
| | | |

| **පළමු වැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|
| 36. හෝමර්ගේ ඉලියඩ් හා ඔඩෙසි යන කෘති රෝම ශිෂ්ටාචාරය ඉගෙනීමට ඇති වැදගත් කෘති වේ. | ප්ලේටෝ දේශපාලන විද්‍යාවේ පියාය. (.....) |
| 37. ග්‍රීසියේ පැවති විවිධ සංකේත වර්තමාන ලෝකයේදී භාවිතා කරයි. | ග්‍රීක වෛද්‍ය ශාස්ත්‍රයේ දී භාවිතා වු සර්පයාගේ ලාංඡනය වෛද්‍ය ක්ෂේත්‍රය හා අදාළ නොයෙකුත් සංවිධාන සඳහා යොදා ගෙන තිබේ. (.....) |
| 38. නවරාජාණ්ඩු වෙළඳාමට දිරිදීම වැඩවසම් ක්‍රමයට බිඳවැටීමට හේතුවිය. | පුනරුදයේදී ග්‍රීක, ලතින් භාෂාවල ප්‍රබෝධයක් ඇතිවිය. (.....) |
| 39. හතරවන හෙන්රි රජු විසින් නැන්ටීස් ආඥාව මගින් හියුගනෝවරුන්ට ආගමික නිදහස ලබා දුනි. | 1588 දී උත්කෘෂ්ට විප්ලවය සිදුවිය. (.....) |
| 40. ෆර්නැන්ඩෝ කෝටේස් විසින් ලෝකය වටා යාත්‍රා කරන ලදී. | 1517 දී ජෝන් ටෙට්සල් විසින් පුණ්‍යඵල පත්‍ර විකුණන ලදී. (.....) |

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

25B | S | II

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය ............................ යුරෝපා ඉතිහාසය II

උපදෙස්

♦ පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමෙහි පහත සඳහන් සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් ඔබ කැමති ස්ථාන දෙකක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

1. ප්‍රංශය 2. ඉංග්‍රීසි ඕඩය 3. ලන්ඩන්
4. ජර්මනිය 5. උතුරු මුහුද 6. ඩැනියුබ් ගඟ
7. සාඩිනියාව 8. පිරනීස් කඳු

(සිතියම් ලකුණු කිරීමට 8 ඓතිහාසික සටහනකට 5 බැගින්) (8 + 5 x2 =18)

02. (i) පහත දැක්වෙන මාතෘකා යටතේ රෝම බල ව්‍යාප්තිය පිළිබඳ විමසීමක් කරන්න.
1. ඉතාලිය ජයග්‍රහණය කිරීම.
2. පියුනික් යුද්ධ
3. හෙලනිස්ටික් රාජ්‍ය යටත් කිරීම. (ල. 7)

03. වැඩවසම් ක්‍රමයේ පරිහානියට බලපෑ හේතු පිළිබඳව විමසීමක් කරන්න. (ල. 14)

04. 'ජාතික රාජ්‍යයක් පොදු වූ ජාතික අනන්‍යතාවයකින් යුක්ත විය.''
(i) යුරෝපයේ පැන නැගී මුල්ම ජාතික රාජ්‍ය කුමක්ද? (ල. 1)
(ii) නව රාජාණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ල. 4)
(iii) ස්පාඤ්ඤය ජාතික රාජ්‍යයක් වීම ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශය විමසන්න. (ල. 9)

05. යුරෝපයේ නව යුගයක් ආරම්භ වීමට දේශ ගවේෂණ ව්‍යාපාරය හා යුරෝපා බල ව්‍යාප්තිය දායකවූ ආකාරය පරීක්ෂා කරන්න. (ල. 14)

06. ''පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය මානව සංහතියේ ප්‍රගමනයට දායකවිය.''
(i) 1215 දී මැග්නාකාර්ටා ප්‍රඥප්තිය අත්සන් කළ රජු කවුද? (ල. 2)
(ii) එහි සඳහන් වගන්ති කෙටියෙන් දක්වන්න. (ල. 3)
(iii) 1215 - 1688 තෙක් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු ක්‍රමයේ වර්ධනය ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශ විමසන්න. (ල. 9)

07. ''ස්වදේශික ගෝත්‍රිකයන් පලවා හරිමින් උතුරු ඇමරිකාවට සංක්‍රමණය වූ යුරෝපා ජාතිකයන් එහි ජනපද පිහිටුවා ගත්හ.''

(i) යුරෝපා ජාතීන් 15 වන සියවසේදී ඇමරිකාවට ගොඩ බසින විට එහි සිටි ස්වදේශික ගෝත්‍ර ජනතාව විසින් ගොඩ නැගූ ශිෂ්ටාචාර 03 ක් ලියන්න. (ල.3)

(ii) යුරෝපා ජාතීන් ඇමරිකාවට සංක්‍රමණය වීමට බලපෑ දේශපාලන, ආර්ථික, හා ආගමික හේතු විමසන්න. (ල.11)

08. (i) ''කාර්මික විප්ලවය ප්‍රධාන වශයෙන් කර්මාන්ත තුනක් ඇසුරින් වර්ධනය විය.'' ඒවා දක්වන්න.(ල.3)

(ii) කාර්මික විප්ලවය හා සම්බන්ධ ප්‍රධාන උත්පාදක ඉහත සඳහන් ක්ෂේත්‍ර තුන යටතේ දක්වන්න. (ල.5)

(iii) කාර්මික විප්ලවයෙන් උද්ගත වූ අහිතකර ප්‍රතිඵල දක්වන්න. (ල.6)

09. පහත සඳහන් මාතෘකාවලින් 02 ක් පිළිබඳව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.

(i) අරාබි හා ක්‍රිස්තියානි ශිෂ්ටාචාර වලින් ලද දායාද

(ii) පුනරුදයෙන් වර්ධනය වූ කලාව හා ගෘහනිර්මාණ ශිල්පය

(iii) ග්‍රීක පෞර රාජ්‍යවල ප්‍රධාන ලක්ෂණ

(iv) හතර වන හෙන්රි රජු


(v) මාටිං ලූතර්

(vi) ඇමරිකාවේ මුල් ජනපදිකන්

(7 x 2)

**12 / 13 යුරෝපා ඉතිහාසය** - 12 / 13 ஐரோப்பிய வரலாறு

| විභාග අංකය<br>சுட்டெண் | |
|---|---|



# තෙවන වාර පරීක්ෂණය 2018 යුරෝපා ඉතිහාසය.

## පිළිතුරු

## 12 ශ්‍රේණිය 1 කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 5 | 11. | 5 | 21. | 2 | 31. | 4 |
| 2. | 4 | 12. | 3 | 22. | 3 | 32. | 4 |
| 3. | 3 | 13. | 5 | 23. | 4 | 33. | 5 |
| 4. | 3 | 14. | 5 | 24. | 4 | 34. | 5 |
| 5. | 1 | 15. | 4 | 25. | 1 | 35. | 5 |
| 6. | 2 | 16. | 5 | 26. | 3 | 36. | 3 |
| 7. | 1 | 17. | 4 | 27. | 5 | 37. | 5 |
| 8. | 2 | 18. | 1 | 28. | 1 | 38. | 2 |
| 9. | 3 | 19. | 2 | 29. | 1 | 39. | 1 |
| 10. | 3 | 20. | 1 | 30. | 1 | 40. | 4 |

### II කොටස පිළිතුරු

01. නිවැරදි සිතියම් ලකුණු කිරීමට ලකුණු 08
ඓතිහාසික සටහන් ලකුණු 10
18

02. (i) ඉතාලිය ජයග්‍රහණය කිරීම.
කුඩා ලතින් රාජ්‍යයක් ලෙස ආරම්භ වීම.
එට්‍රස්කන්වරුන්ගේ ආක්‍රමණ වලට ගොදුරු වීම.
එට්‍රස්කන්වරු නෙරපා දමා සමූහාණ්ඩුවක් පිහිටුවීම.
උතුරු ඉතාලියේ බලය පිහිටුවීම.
දකුණු ඉතාලියේ තිබූ ග්‍රීක පෞර රාජ්‍ය ජයගැනීම.
පියුනනික් යුද්ධ
කාතේජවරුන් සමග කරන ලද යුද්ධ
ප්‍රධාන යුද්ධ තුන දක්වන්න.
එම යුද්ධවලින් ජයගෙන උතුරු අප්‍රිකාවේ රෝම බලය පැතිර වීම.
හෙලනිස්ටික් රාජ්‍ය යටත් කිරීම.
ග්‍රීක පෞර රාජ්‍ය යටත් කර ගැනීම.
මැසිඩෝනියානු අධිරාජ්‍යයට අයත් ප්‍රභේදවල බලය ව්‍යාප්ත කිරීම. (ල. 14)

03. කුරුස යුද්ධ, වෙළෙඳාමේ දියුණුව, කොන්ස්තන්තෝපලය ප්‍රධාන වෙළඳ මධ්‍යස්ථානය වීම.
නව රාජාණ්ඩු වෙළෙඳාමට දිරිදීම.
නගරවර්ධනය
මධ්‍යම පන්තියේ නැගීම.

04. (i) එංගලන්තය (ල.01)
(ii) නිශ්චිත දේශසීමාව, ස්වෛරී රාජාණ්ඩුව, ප්‍රාදේශීය නායකයන්ගේ බලය සීමා වීම, පෞද්ගලික හමුදා අහෝසි කිරීම, ජාතික නීති පද්ධතිය, ජාතික බදු ප්‍රතිපත්තිය (ල. 4)
(iii) ෆර්ඩිනන්ඩ් හා ඉසබෙලාගේ විවාහය
ප්‍රාදේශීය රාජ්‍යයන් ඈදා ගැනීම, නේපල්ස්, සිසිලි, සාර්ඩිනියා ප්‍රදේශවල ආධිපත්‍ය පිහිටුවීම, නව ප්‍රතිසංස්කරණ ඇති කිරීම, පොදු නීති පද්ධතියක් ඇති කිරීම, I චාල්ස් රජුගේ සේවාවන්, II පිලිප් රජුගේ සේවාවන් (ල. 9)

05. (i) ආසියා, අප්‍රිකා, ලතින් ඇමරිකා යන මහද්වීපවල යුරෝපා බලය ව්‍යාප්ත වීම.
ක්‍රිස්තු ධර්මය අසියා, අප්‍රිකා, ඇමෙරිකා මහද්වීපවල පැතිරීම.
කාර්මික විප්ලවයට මග පෑදීම.
යුරෝපානු සංස්කෘතික හා තාක්ෂණය ලොව පුරා ව්‍යාප්ත වීම.
යුරෝපීය අධිරාජ්‍ය ගොඩනැගීම.
නව වෙළඳ සබඳතා (ල. 14)

06. (i) III ජෝන් රජු (ල. 2)
(ii) රජුගේ බලය සීමා වීම.
මහාසභාවේ අනුමැතිය නොමැතිව රජුට බදු අයකිරීමට බලයක් නොමැති වීම.
නඩු විසඳීමකින් තොරව රජුට වැසියන්ට දඩුවම් දිය නොහැකිවීම.
මෙම නීතිකඩ කල විට රජුට දඩුවම් දිය හැකි වීම. (ල. 3)

(iii) නිවැරදි පිළිතුරට ලකුණු දෙන්න. (ල.9)

07. (i) හොප්වෙල් ගෝත්‍ර ශිෂ්ටාචාරය, ඉරොක්කොයිස් ගෝත්‍ර ශිෂ්ටාචාරය, පියුබ්ලෝ ගෝත්‍ර ශිෂ්ටාචාරය , මායා ගෝත්‍ර ශිෂ්ටාචාරය, ඉන්කා ගෝත්‍ර ශිෂ්ටාචාරය, ඇස්ටෙක් ගෝත්‍ර ශිෂ්ටාචාරය (ල. 3)

(ii) **දේශපාලන හේතු**
ජාතික රාජ්‍ය බිහිවීම, මධ්‍යම පන්තිය බලවත් වීම, පාලකයන් දේශගවේශකයන්ට අනුග්‍රහ දැක්වීම.
**ආර්ථික හේතු**
වානිජවාදී අදහස් ව්‍යාප්ත වීම, සනරන්වාදය
**ආගමික**
ආගමික නිකායන් අතර ගැටීම, එංගලන්තයේ අටවැනි හෙන්රි රජු රෙපරමාදු ආගම වැළඳ ගැනීම, මේරි ටියුඩර් රෙපරමාදුවාදීන්ට හිරිහැර කිරීම, රෝමානු කතෝලික ආගම ව්‍යාප්ත කිරීමේ අභිලාසය (ල. 11)

08. (i) පේෂ කර්මාන්තය
යකඩ හා වානේ කර්මාන්තය
ගල් අඟුරු කර්මාන්තය (ල.3)

(ii) පේෂ කර්මාන්ත
දුවන නඩාව / ස්පිනිං ජෙනිය / ජල රාමුව / මියුල් යන්ත්‍රය / කොටින් ජන් / රෙදි විවීමේ යන්ත්‍රය / බලවේග රෙදි වියන යන්ත්‍රය
සොයා ගත් පුද්ගලයාගේ නමද ලියන්න.
යකඩ හා වානේ කර්මාන්තය
යපස් උණු කිරීමෙන් වාස්තු කළ යකඩ නිපදවීමට
රෝලර් නම් යන්ත්‍රය
පහසුවෙන් යකඩ නිපදවීමේ ක්‍රමය
විවෘත උදුන් ක්‍රමය
ගල් අඟුරු කර්මාන්තය
වාෂ්ප එංජිම / ආරක්ෂක ලාම්පුව
මේවා නිපද වූ අයගේ නම් ද සඳහන් කළ යුතු වේ. (ල.5)

(iii) පන්ති අරගල
නාගරීකරණය
පරිසර දූෂණය
ගම් පාළු වීම / ඉඩම් අහිමි පුද්ගලයන් බිහි වීම.
සම්ප්‍රදායික සමාජ සංස්ථා අවුල් වීම.
ශ්‍රමය සූරා කෑම
වෘත්තීය සංගම් බිහිවීම.
අධිරාජ්‍යවාදය පුළුල් වීම. (ල.6)

09. නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න. (7 x 2 = 14)